# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,920 — 1970 අගෝස්තු 21 වැනි සිකුරාදා — 1970.8.21

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි.)

# IV වැනි කොටස—පළාත් පාලනය

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යෙදූ ඇත)



| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන ... ... ... | 571 | ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... | 580 |
| ඝනකුරු-ඇබෑර්තු ... ... ... | 575 | අය-වැය ලේඛන ... ... ... | 583 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — | දේපල විකිණීම ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | 577 | මාර්ග කොමිටි දැන්වීම් ... ... ... | — |
| පළාත් පාලන සභා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් ... | 579 | විවිධ දැන්වීම් ... ... ... ... | 587 |



සැලකිය යුතුයි.—මෙවර ප්‍රසිද්ධ කරනු ලබන ගැසට් පත්‍රයේ VI වැනි කොටසේ ජූරි සභිකයන්ගේ සහ උපදේශකවරුන්ගේ නාම ලේඛනයක් පළවේ.

## පළාත් පාලන නිවේදන

ඇල්.ජී.—බී. 69/41.

### ගම්සභා ආඥාපනත

(257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 37(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, රජ්‍ය පරිපාලන පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමති ෆිලික්ස් රෙජිනෝල්ඩ් ඩයස් බණ්ඩාරනායක වන මම මෙම නිවේදනයෙන් මඩකලපුව දිස්ත්‍රික්කයේ පුතුකුඩියිරිප්පු ගම් ප්‍රදේශයේ ගම් සභාවට, එකී ආඥාපනතේ 37 වැනි වගන්තිය යටතේ ඉඩම් බද්දක් පනවා අය කිරීමට බලය පවරමි.

ෆීලික්ස් ආර්. ඩී. බණ්ඩාරනායක,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමති.

1970 අගෝස්තු මස 6 වැනි දින,
කොළඹ දීය.

8–775—70.8.21 දින අංක 14,920 දරන ගැසට් පත්‍රය

---

ඇල්.ඩී.—බී. 139/46.

### චාවකච්චේරි නගර සභාව

#### විනෝද බදු ආඥාපනත

(267 වැනි අධිකාරය වන) විනෝද බදු ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ චාවකච්චේරි නගර සභාව විසින් සම්මත කරනු ලැබූ පහත දැක්වෙන යෝජනාව රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමතිවරයා විසින් අනුමත කරනු ලැබ, ඒ වගන්තියේ (2) වැනි උපවගන්තිය අනුව පළ කරනු ලැබේ.

යෝජනාව

1961.2.21 දින හා අංක 12,298 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද යෝජනාව මඟින් පනවා අය කරන ලද බද්ද වෙනුවට (267 වැනි අධිකාරය වන) විනෝද බදු ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ, මෙම සභාව විසින් එහි පරිපාලන සීමා ඇතුළත ප්‍රදේශයෙහි පැවැත්වෙන (ඒ ආඥාපනතෙහි විස්තර කොට ඇති) විනෝද කටයුතු සඳහා ඇතුළුවීම පිණිස අයකරනු ලබන ගෙවීම් වලින් මෙහි පහත දැක්වෙන ප්‍රමාණ අනුව බද්දක් මේ යෝජනාව ගැසට් පත්‍රයෙහි පළ වන දින සිට මෙයින් පනවා අයකරනු ලැබේ.

---

සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ

### විශේෂ නිවේදනයයි

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථොක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1968 දෙසැම්බර් මස 14 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුව,
කොළඹ.

ඇල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

### අය කරනු ලබන මුදල් ප්‍රමාණය

| බදු ප්‍රමාණය | රු. | ශ. |
|---|---|---|
| බදු ප්‍රමාණය හැර ඇතුළුවීමේ ගාස්තුව— | | |
| (අ) ශත 25 කට අඩු නොවන නමුත් ශත 40 ට වැඩි නොවන විට ... ... | 0 | 5 |
| (ආ) ශත 40 කට වැඩි වන නමුත් ශත 50 ට වැඩි නොවන විට ... ... | 0 | 10 |
| (ඇ) ශත 50 ට වැඩි වන නමුත් රු. 1 ට වැඩි නොවන විට ... ... | 0 | 20 |
| (ඈ) රු. 1 ට වැඩි වන නමුත් රු. 1.50 ට වැඩි නොවන විට ... ... | 0 | 30 |
| (ඉ) රු. 150 ට වැඩි නමුත් රු. 2 ට වැඩි නොවන විට ... | 0 | 40 |
| (ඊ) රු. 2 වැඩි වන නමුත් රු. 3 ට වැඩි නොවන විට ... | 0 | 60 |
| (උ) රු. 3 ට වැඩි වන නමුත් රු. 4 ට වැඩි නොවන විට ... | 0 | 80 |
| (ඌ) රු. 4 ට වැඩි වන නමුත් රු. 5 ට වැඩි නොවන විට | 1 | 0 |
| (එ) රු. 5 ට වැඩිවන නමුත් රු. 10 ට වැඩි නොවන විට | 2 | 0 |
| (ඒ) රු. 10 ට වැඩි වන විට— | | |
| (1) 1 වැනි රු. 10 ට ... ... | 2 | 0 |
| (2) ඊට වැඩි වන එක් එක් රු. 5 ට හෝ ඉන් කොටසකට ... ... | 1 | 0 |

පී. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු
අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970.8.7 වැනි දින,
කොළඹ දී ය.

8–771—70.8.21 දින අංක 14,920 දරන ගැසට් පත්‍රය

---

ඇල්.ඕ.—බී 27/39.

## ගම්සභා ආඥාපනත

(257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 5 වැනි වගන්තිය යටතේ රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු ඇමතිවරයා විසින් පනවන ලද ආඥාව.

ෆීලික්ස් ආර්. ඩී. බණ්ඩාරනායක,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ
කටයුතු පිළිබඳ අමති.

1970 අගෝස්තු මස 7 වැනි දින,
කොළඹ දී ය.

### ආඥාව

1969 නොවැම්බර් මස 14 වැනි දින අංක 14,880 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද බදුල්ල දිස්ත්‍රික්කයේ කැප්පෙටිපොල ගම් ප්‍රදේශයේ සීමා වෙනස් කිරීම සහ නැවත නිරූපණය කිරීම පිළිබඳවූ ආඥාව, එහි වූ උපලේඛනයේ "කැප්පෙටිපොල" යන වචනය වෙනුවට "දෙහිපොල" යන වචනය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

8–764/1—70.8.21 දින අංක 14,920 දරන ගැසට් පත්‍රය

---

ඇල්.ඕ.—බී. 27/39.

## ගම්සභා ආඥාපනත

(257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 8(1අ) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමති ෆීලික්ස් රෙජිනෝල්ඩ් ඩයස් බණ්ඩාරනායක වන මම මෙම නිවේදනයෙන්—

(1) බදුල්ල දිස්ත්‍රික්කයේ කැප්පෙටිපොල ගම් ප්‍රදේශයේ අංක 3 දරන කොට්ඨාශය වූ වැලිමඩගම සීමාවන් පහත සඳහන් පරිදි විය යුතු යයි ප්‍රකාශ කරමි.

"අංක 3 දරන ඡන්ද කොට්ඨාශය වූ වැලිමඩගම, වැලිමඩ සුළු නගර සභාවේ පාලන සීමාවන්ට ඇතුළත් කොටස හැර දෙහිපොල (48) ග්‍රාමසේවක කොට්ඨාශයේ වැලිමඩගම ගමින් සමන්විත විය යුතුය."

(2) තවද මෙම නිවේදනයේ විධිවිධාන 1971 ජනවාරි මස 1 දින සිට ක්‍රියාත්මක විය යුතුයයිද ප්‍රකාශ කරමි.

ෆීලික්ස් ආර්. ඩී. බණ්ඩාරනායක,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ
කටයුතු පිළිබඳ අමති.

1970 අගෝස්තු මස 7 වැනි දින,
කොළඹ දී ය.

8–764/2—70.8.21 දින අංක 14,920 දරන ගැසට් පත්‍රය

---

ඇල්.ඕ.—බී. 39/52 : ඇල්.ජී.ඕ./එච්.ඒ./1/3/5.

## ගම්සභා ආඥාපනත

(257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 47 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමති ෆීලික්ස් රෙජිනෝල්ඩ් ඩයස් බණ්ඩාරනායක වන මම, එකී වගන්තියේ (1) වැනි උපවගන්තිය, මන්නාරම දිස්ත්‍රික්කයේ මාන්තෙයි උතුර ප්‍රදේශයේ ගම් සභාව සම්බන්ධයෙන් අදාල නොවිය යුතු බැව් මෙයින් ප්‍රකාශ කරමි.

ෆීලික්ස් ආර්. ඩී. බණ්ඩාරනායක,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ
කටයුතු ඇමති.

1970 ජූලි මස 20 වැනි දින,
කොළඹ දී ය.

8–758—70.8.21 දින අංක 14,920 දරන ගැසට් පත්‍රය

---

ඇල්.ඕ.—බී. 11/68.

## ගම් සභා ආඥාපනත

(257 වැනි අධිකාරය වන) ගම් සභා ආඥාපනතේ 42 වැනි වගන්තිය යටතේ රත්නපුර දිස්ත්‍රික්කයේ බඹරබොටුව ගම් ප්‍රදෙශයේ ගම් සභාව විසින් සම්පාදිතව, එකී වගන්තියේ (3) වැනි උප වගන්තිය යටතේ රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

පී. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු
අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 අගෝස්තු මස 7 වැනි දින,
කොළඹ.

### අතුරු ව්‍යවස්ථා

### ගොඩනැගිලි, මායිම් තාප්ප සහ දොරටු මාර්ග සෑදීම

1. කිසිම තැනැත්තකු විසින් ගම් ප්‍රදේශය තුළ—

(අ) යම් ගම්බද පාරක මැද සිට අඩි විස්සක දුර ප්‍රමාණයක් ඇතුළත හෝ

(ආ) යථා කාලයේ දී ගම්බද පාරක් බවට පරිවර්තනය කරනු ලැබේ යයි සභාව විසින් නිවේදනය කොට ඇති යම් ගම්බද මාවතක මැද සිට අඩි විස්සක දුර ප්‍රමාණයක් ඇතුළත හෝ,

(ඇ) (ආ) ඡේදයේ සඳහන් මාවතක් හැර වෙන යම් මාවතක් මැද සිට අඩි දහයක දුර ප්‍රමාණයක් ඇතුළත කිසිම ගොඩනැගිල්ලක්, මායිම් තාප්පයක් හෝ දොරටු මාර්ගයක්, නොසෑදිය යුතුය.

2. යම් ගොඩනැගිල්ලක්, මාසිම් තාප්පයක් හෝ දොරටු මාර්ගයක් සෑදීම ආරම්භ කිරීමට බලාපොරොත්තු වන දිනයට යටත් පිරිසෙයින් දින තිහකට කලින් ඒ අදහස පිළිබඳව ලිඛිත දැන්වීමක් සභාපති වෙත ඉදිරිපත් කොට ඒ සඳහා අවසර පත්‍රයක් ඔහුගෙන් ලබාගතහොත් මිස 1 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ගම්බද මාවතක් හෝ පාරක් අයිනේ යම් ගොඩනැගිල්ලක්, මාසිම් තාප්පයක් හෝ දොරටු මාර්ගයක් සෑදීම කිසිම තැනැත්තෙකු විසින් ආරම්භ නොකළ යුතුය.

3. 2 වැනි අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන උල්ලංඝණය කරමින් යම් තැනැත්තකු විසින් අළුත් ගොඩනැගිල්ලක්, මාසිම් තාප්පයක් හෝ දොරටු මාර්ගයක් ඉදිකොට හෝ ඉදිකිරීම ආරම්භ කර තිබෙන විට ලියවිල්ලකින් වූ දැන්වීමක් එම තැනැත්තා වෙත භාරදෙනු ලැබීමෙන් පසු ඒ ගොඩනැගිල්ල, මාසිම් තාප්පය හෝ දොරටු මාර්ගය කඩා දමන ලෙස සභාපති විසින් ඔහුට නියම කළ හැකිය.

4. 3 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ දැන්වීමක් භාරදෙනු ලැබූ සෑම තැනැත්තකු විසින්ම, ඒ දැන්වීමේ නිශ්චිතව සඳහන් කාලය ඇතුළත ඒ දැන්වීමේ සඳහන් ගොඩනැගිල්ල, මාසිම් තාප්පය හෝ දොරටු මාර්ගය කඩා දැමීම හෝ කඩා දමනු ලැබීමට සැලැස්වීම කළ යුතුය.

## නිලධරයන් හා සේවකයන්

5. සභාවට ලැබිය යුතු සියලුම අයබදු හෝ ගාස්තු එකතු කොට සභාවේ මුද්‍රාව හා සභාපතිගේ අත්සනේ ප්‍රතිරූපය ඇති මුද්‍රිත කුවිතාන්සි නිකුත් කිරීම පිණිස සභාපති විසින් යම් නිලධරයකුට හෝ වෙන තැනැත්තකුට ලියවිල්ලකින් බලය පැවරිය හැකිය.

6. කිසිම තැනැත්තෙකු විසින්—

(අ) ආඥාපනතේ හෝ ඒ යටතේ සම්පාදිත යම් අතුරු ව්‍යවස්ථා වක යම් විධිවිධාන යටතේ සභාපති වෙත හෝ සභාවේ වෙන යම් නිලධරයකු වෙත පැවරී හෝ නියම වී ඇති යම් බලතල පාවිච්චි කිරීමේදී හෝ පවරනු ලැබ හෝ නියමව ඇති යම් යුතුකමක් ඉටු කිරීමේදී හෝ නියම කොට ඇති යම් කාර්යයක් ක්‍රියාවේ යෙදවීමේදී ඒ සභාපතිට හෝ නිලධාරියාට, හෝ

(ආ) සභාව විසින් හෝ සභාව වෙනුවෙන් සේවයෙහි යොදා ගන්නා ලද යම් සේවකයකුට හෝ කම්කරුවෙකුට සභාපති විසින් හෝ සභාවේ යම් නිලධාරියෙකු විසින් නීත්‍යානුකූලව පවරා තිබෙන යම් යුතුකමක් ඉටු කිරීමේදී ඒ සේවකයාට හෝ කම්කරුවාට ඕනෑකමින් බාධා නොකළ යුතුය.

## ප්‍රසිද්ධ දැන්වීම්

7. කිසිම තැනැත්තෙකු විසින් සභාවේ අණ පිට ප්‍රදර්ශනය කර තිබෙන යම් දැන්වීමක් විරූප කිරීම හෝ විනාශ කිරීම නොකළ යුතුය.

8. ආඥාපනතේ හෝ එය යටතේ සම්පාදිත යම් අතුරු ව්‍යවස්ථාවක යම් විධිවිධාන යටතේ සභාව විසින් කරගෙන යනු ලබන වැඩක් සම්බන්ධයෙන් සභාපති විසින් හෝ සභාපතිගේ බලය යටතේ සවි කරන ලද යම් කිසි දැන්වීම් පුවරුවක්, වැටක්, කණුවක්, බාධකයක් නැතහොත් වෙන යම් දෙයක් ඉවත් කිරීම හෝ යම් දැන්වීමක සඳහන් නියමයක් ඕනෑකමින් කඩ කිරීම කිසිම තැනැත්තෙකු විසින් නොකළ යුතුය.

## සංචාරක වෙළෙන්දෝ

9. සභාපති විසින් ඒ සඳහා නිකුත් කරන ලද බලපත්‍රයක් ඇතිව මිස කිසිම තැනැත්තකු විසින් සංචාරක වෙළෙන්දෙකු වශයෙන් එළවළු, පළතුරු, මාළු හෝ මස් වෙළඳාම පවත්වාගෙන නොයා යුතුය.

10. 9 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක්ම එය නිකුත් කරනු ලැබූ අවුරුද්දේ දෙසැම්බර් මස 31 වෙනි දින අවසන් විය යුතුය.

11. 9 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් සඳහා වූ සෑම ඉල්ලීමක්ම සභාව විසින් ඒ සඳහා සපයා ඇති ආකෘති පත්‍රයෙහි විය යුතු අතර—

(අ) ඒ ඉල්ලීම අළුතින් බලපත්‍රයක් සඳහා නම් ඒ බලපත්‍රය අවශ්‍ය ව්‍යාපාරය පටන් ගැනීමට දින තිහකට නොඅඩු කලකට පෙර ද,

(ආ) ඒ ඉල්ලීම දැනට තිබෙන බලපත්‍රයක් අළුත් කිරීම සම්බන්ධයෙන් නම් බලපත්‍රය අවශ්‍ය අවුරුද්දට කලින් අවුරුද්දේ සැප්තැම්බර් මස පළමුවෙනි දින හෝ ඊට පෙර ද ඒ ඉල්ලීම සභාපති වෙත ලැබෙන සේ ඉදිරිපත් කළ යුතුය.

## බලපත්‍ර හා අවසර පත්‍ර සඳහා අයකුම්

12. සභාව විසින් පිළිගන්නා ලද සම්මත අතුරු ව්‍යවස්ථාවල 7, 10, 11, 12, 13, 14, 15, 16, 17, 18, 19, 20, 22, 27 සහ 38 කොටස්වල සඳහන් අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක්ම, එම අතුරු ව්‍යවස්ථා යටතේ කලින් අවලංගු නොකරන ලද්දේ නම්, ඒ බලපත්‍රය නිකුත් කරන ලද වර්ෂයේ දෙසැම්බර් මස 31 වෙනි දින අවලංගු විය යුතුය.

13. සභාව විසින් පිළිගන්නා ලද සම්මත අතුරු ව්‍යවස්ථාවල 7, 10, 11, 12, 13, 14, 15, 16, 17, 18. 19, 20, 22, 27 සහ 38 යන කොටස්වල සඳහන් අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රයක් සඳහා වූ සෑම ඉල්ලීමක්ම සභාව විසින් ඒ සඳහා සපයා ඇති ආකෘතියෙහි විය යුතු අතර,

(අ) ඒ ඉල්ලීම අළුත් බලපත්‍රයක් සම්බන්ධයෙන් නම් ඒ බලපත්‍රය අවශ්‍ය ව්‍යාපාරය පටන් ගැනීමට දින තිහක කාලයකට පෙර ද,

(ආ) ඒ ඉල්ලුම් පත්‍රය දැනට තිබෙන ඉල්ලුම් පත්‍රයක් අළුත් කිරීම සඳහා නම් බලපත්‍රය අවශ්‍ය අවුරුද්දට කලින් අවුරුද්දේ සැප්තැම්බර් මස පළමුවෙනි දින හෝ ඊට පෙර ද, එම ඉල්ලීම සභාපති වෙත ලැබෙන සේ ඉදිරිපත් කළ යුතුය.

## සේදීම හා නෑම

14. කිසිම තැනැත්තකු විසින් යම් පොදු ළිඳකින් හෝ ස්නානය කරන ස්ථානයකින් වතුර ගැනීමේ කාර්යය සඳහා යම් අපිරිසිදු භාජනයක් පාවිච්චි නොකළ යුතුය.

15. යම් පොදු ළිඳක, පීල්ලක, පොදු ජල කණුවක හෝ වෙනත් ජල ස්ථානයක සේදීම හෝ නෑම සභාව විසින් යෝජනාවකින් තහනම් කිරීම නීත්‍යානුකූල විය යුතුය.

16. (1) යම් වැවක හෝ වෙනත් ජල ස්ථානයක සේදීම, නෑම හෝ මිනිසුන්ගේ ප්‍රයෝජනය හෝ සතුන් නෑවීම සඳහා ජලය ලබා ගැනීම පිණිස විශේෂ ස්ථාන සභාව විසින් ස්වකීය අභිමතය පරිදි වෙන් කළ හැකිය. වාරිමාර්ග ආඥාපනත යටතේ ව්‍යවස්ථා පනවනු ලැබූ යම් වාරිමාර්ග කර්මාන්තයක් සම්බන්ධයෙන් මේ ඡේදයේ වූ කිසිවක් අදාළ නොවිය යුතුය.

(2) යම් කාර්යයක් සඳහා සභාව විසින් වෙන් කර ඇති යම් ස්ථානයක් වෙන යම් කාර්යයක් සඳහා කිසිම තැනැත්තකු විසින් පාවිච්චි නොකළ යුතුයි.

17. ගම් ප්‍රදේශයෙහි ජල හිඟයක් පවතින්නේ යයි සභාව විසින් ප්‍රකාශ කර තිබෙන විට සභාව විසින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් කාල සීමාවක් ඇතුළත දී කිසිම තැනැත්තකු විසින් යම් පොදු ළිඳකින්, වැවකින්, පොදු ජල කණුවකින් හෝ වෙනත් ජල ස්ථානයකින් කිසිම ජලයක් කරත්තයකින් හෝ පීප්පයකින් ගෙන යාම හෝ සභාපති විසින් වරින් වර නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් ප්‍රමාණයකට අධික යම් ජල ප්‍රමාණයක් ඒ පොදු ළිඳෙන්, පොදු ජල කණුවකින්, වැවකින් හෝ වෙනත් ජලස්ථානයකින් සභාපතිගේ ලිඛිත අවසරය නොමැතිව ගෙන යාම හෝ ගෙන යනු ලැබීමට සැලැස්වීම නොකළ යුතුය.

18. උල්පතකින් පෝෂණය වන ළිඳක් පිහිටා තිබෙන යම් ඉඩමක අයිතිකරු, පදිංචිකරු, හවුල් අයිතිකරු හෝ බදුකරු විසින්, ඒ ළිඳට හිරු එළිය වැටීම වළක්වාලනු පිණිස ඊට සුදුසු ආවරණයක් සැපයිය යුතුය.

19. මේ අතුරු ව්‍යවස්ථාවල—

"සභාපති" යනුවෙන් සභාවේ සභාපති අදහස් වේ.

"සභාව" යනුවෙන් බඹරබොටුව ගම් ප්‍රදේශයේ ගම් සභාව අදහස් වේ.

"ආඥාපනත" යනුවෙන් (257 වැනි අධිකාරය වන) ගම් සභා ආඥාපනත අදහස් වේ.

8–778—70.8.21 දින අංක 14,920 දරන ගැසට් පත්‍රය

ඇල්.ඩී.—බී. 139/46.

## විනෝද බදු ආඥපනත

(267 වැනි අධිකාරය වන) විනෝද බදු ආඥපනතේ 2 වෙනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මොණරාගල දිස්ත්‍රික්කයේ බින්තැන්න දකුණ ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්මත කරගනු ලැබූ පහත දැක්වෙන යෝජනාව රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමතිවරයා විසින් අනුමත කරනු ලැබ, ඒ වගන්තියේ (2) වැනි උප වගන්තියේ ප්‍රකාර පළ කරනු ලැබේ.

### යෝජනාව

" (267 වැනි අධිකාරය වන) විනෝද බදු ආඥපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ, මෙම ගම්සභාව විසින්, එහි පරිපාලන සීමාව ඇතුළත පැවැත්වෙන (ආඥපනතේ විස්තර කර ඇති පරිදි) විනෝද කටයුතු සඳහා ඇතුළුවීම පිණිස අය කරනු ලබන ගෙවීම්වලින් පහත සඳහන් ප්‍රමාණයන් අනුව වූ බද්දක්, මෙම යෝජනාව ගැසට් පත්‍රයේ පළ වන දින සිට පනවා අය කරනු ලැබේ :—

### අය කරන මුදල් ප්‍රමාණය

බදු ප්‍රමාණය හැර ඇතුළුවීමේ ගාස්තුව—

| | | රු. ශ. |
|---|---|---|
| (අ) | ශත 10කට අඩු නොවන නමුත් ශත 50කට වැඩි නොවන විට ... ... ... | 0 05 |
| (ආ) | ශත 50කට වැඩි නමුත් රු. 1කට වැඩි නොවන විට | 0 10 |
| (ඇ) | රු. 1කට වැඩි නමුත් රු. 1.50කට වැඩි නොවන විට | 0 15 |
| (ඈ) | රු. 1.50කට වැඩි නමුත් රු. 2කට වැඩි නොවන විට | 0 20 |
| (ඉ) | රු. 2කට වැඩි නමුත් රු. 3කට වැඩි නොවන විට ... | 0 30 |
| (ඊ) | රු. 3කට වැඩි නමුත් රු. 5කට වැඩි නොවන විට ... | 0 40 |
| (උ) | රු. 5කට වැඩි වන විට ගෙවන මුදලින් සියයට 25ක්." | |

පී. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 අගෝස්තු මස 12 වෙනි දින,
කොළඹ දිය.

8–754—70.8.21 දින අංක 14,920 දරන ගැසට් පත්‍රය

---

ඇල්.ඩී.—බී 139/46

## විනෝද බදු ආඥපනත

(267 වැනි අධිකාරය වන) විනෝද බදු ආඥපනතේ 2 වන වගන්තියේ (1) වෙනි උප වගන්තිය යටතේ යාපනය දිස්ත්‍රික්කයේ තෙල්ලිපලෙයි ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්මත කරගනු ලැබූ පහත දැක්වෙන යෝජනාව රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමතිවරයා විසින් අනුමත කරනු ලැබ, ඒ වගන්තියේ (2) වන උප වගන්තිය අනුව පළ කරනු ලැබේ.

### යෝජනාව

" (267 වැනි අධිකාරය වන) විනෝද බදු ආඥපනතේ 2 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ මේ සභාව විසින්, සභාවේ පරිපාලන සීමා ඇතුළත ප්‍රදේශයෙහි පැවැත්වෙන (ආඥපනතේ විස්තර කර ඇති) විනෝද කටයුතු සඳහා ප්‍රවේශවීම පිණිස අය කරනු ලබන ගෙවීම්වලින්, මෙහි පහත දැක්වෙන ප්‍රමාණ අනුව බද්දක්, මේ යෝජනාව ගැසට් පත්‍රයේ පළ වන දින සිට මෙයින් පනවා අය කරනු ලැබේ.

| ගෙවන මුදල | | බදු ප්‍රමාණය |
|---|---|---|
| බදු ප්‍රමාණය හැර ප්‍රවේශ ගාස්තුව— | | |
| (අ) | ශත 20 ට අඩු නොවන නමුත් ශත 50 ට වැඩි නොවන විට ... ... | 0 05 |
| (ආ) | ශත 50 ට වැඩි නමුත් රු. 1 ට වැඩි නොවන විට ... | 0 10 |
| (ඇ) | රු. 1 ට වැඩි නමුත් රු. 1.50 ට වැඩි නොවන විට ... | 0 15 |
| (ඈ) | රු. 1.50 ට වැඩි නමුත් රු. 2 ට වැඩි නොවන විට ... | 0 20 |
| (ඉ) | රු. 2 ට වැඩි නමුත් රු. 3 ට වැඩි නොවන විට ... | 0 30 |
| (ඊ) | රු. 3 ට වැඩි නමුත් රු. 4 ට වැඩි නොවන විට ... | 0 40 |
| (උ) | රු. 4 ට වැඩි නමුත් රු. 5 ට වැඩි නොවන විට ... | 0 50 |
| (ඌ) | රු. 5 ට වැඩි නමුත් රු. 10 ට වැඩි නොවන විට ... | 1 0 |
| (එ) | රු. 10 ට වැඩිවන විට— | |
| | (1) පළමුවැනි රු. 10 ට ... ... | 1 0 |
| | (2) එක් එක් අතිරේක රු. 5 ට හෝ ඉන් කොටසකට ... ... | 1 0" |

පී. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා සවදේශ
කටයුතු අමාත්‍යාංශයේ සථිර ලේකම්.

1970 අගෝස්තු මස 12 වෙනි දින,
කොළඹ දී ය.

8–753—70.8.21 දින අංක 14,920 දරන ගැසට් පත්‍රය

---

## ගම්සභා ආඥපනත

(257 වැනි අධිකාරය) ගම්සභා ආඥපනතෙහි 13 (1) වගන්තියෙන් මා වෙත පැවරුන බලතල ප්‍රකාර, ගාල්ල පාලන දිස්ත්‍රික්කයේ සහකාර පළාත් පාලන කොමසාරිස්, වික්‍රමරත්න කොඩිපිලි ආරච්චි පටබැඳිගේ පර්සි අබේසිංහ වන මම, ගාලු දිස්ත්‍රික්කයේ ගෝනපීනුවල-මීටියාගොඩ ගම්සභාවෙහි අංක 7 දරණ අළුත්වල කොට්ඨාශයෙහි සභික මල්ලියාවඩු කීර්තිසේන මහත්මයා සභාවට දැන්වීමක් නොමැතිව පිළිවෙලින් සභාවේ රැස්වීම් වාර තුනකට වැඩි ගණනකට, තමන් තෝරා පත්කරගනු ලැබීමෙන් පසු නොපැමිණි බව ගැන සෑහීමකට පත්ව, ගාලු දිස්ත්‍රික්කයේ ගෝනපීනුවල-මීටියාගොඩ ගම්සභාවෙහි අංක 7 දරණ කොට්ඨාශයෙහි සභික මල්ලියාවඩු කීර්තිසේන මහත්මයා මෙම දැන්වීම් ගැසට් පත්‍රයේ පළකිරීමේ දින සිට තම සභිකත්වය අත්හරින ලද බව, මෙයින් ප්‍රකාශ කරමි.

ඩබ්ලිව්. කේ. ඒ. පී. පී. අබේසිංහ,
පළාත් පාලන සහකාර කොමසාරිස්, ගාල්ල.

1970 අගෝස්තු 11 දින, ගාල්ලේ
පළාත් පාලන අමාත්‍යාංශ කාර්යාලයේ දීය.

8–781—70.8.21 දින අංක 14,920 දරන ගැසට් පත්‍රය

---

ඇල්.ඩී—බී. 69/41.

## ගම්සභා ආඥපනත

(257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥපනතේ 37 වෙනි වගන්තියේ (1) වන උප වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල ප්‍රකාර, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමති ෆිලික්ස් රෙජිනෝල්ඩ් ඩයස් බණ්ඩාරනායක වන මම, එකී වගන්තිය යටතේ කොළඹ දිස්ත්‍රික්කයේ තලාහේන ගම්සභා ප්‍රදේශය තුළ ඉඩම් බද්දක් පනවා අයකිරීමට එකී ගම්සභාවට මේ නිවේදනයෙන් බලය පවරමි.

ෆිලික්ස් ආර්. ඩී. බණ්ඩාරනායක,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ
කටයුතු ඇමති.

1970 ජූලි 28 දින,
කොළඹ දීය.

8–776/1—70.8.21 දින අංක 14,920 දරන ගැසට් පත්‍රය

---

ඇල්.ඩී.—බී. 69/41.

## ගම්සභා ආඥපනත

(257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥපනතේ 37 (2) වැනි වගන්තිය යටතේ රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමතිවරයා විසින් පනවනු ලැබූ ආඥවයි.

ෆිලික්ස් ආර්. ඩී. බණ්ඩාරනායක,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ
කටයුතු ඇමති.

1970 අගෝස්තු 6 වැනි දින,
කොළඹ දීය.

### ආඥව

තලාහේන ගම්සභාවේ පාලන සීමා ඇතුලත ප්‍රදේශය ගම්සභා ආඥපනතේ 37 වැනි වගන්තියේ (2) වැනි උප වගන්තියට අයත් තුන්වැනි අතුරු විධානයෙහි සඳහන් අක්කර බද්ද පනවා අයකිරීම සඳහා විශේෂ ප්‍රදේශයක් විය යුතු බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

8–776/2—70.8.21 දින අංක 14,920 දරන ගැසට් පත්‍රය

# තනතුරු — ඇබෑර්තු

## ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි IV වැනි කොටසෙහි පළ කෙරෙන පළාත් පාලන සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසි

1. දීමනා.—රජයේ නිලධාරීන්ට අදාළ වන ප්‍රමාණයන් හා කොන්දේසි අනුව විවාහක දීමනාවක් ගෙවනු ලැබේ.

2. සේවා කොන්දේසි.—පත්වීම් වූ කලී 1969 අංක 18 දරණ පළාත් පාලන සේවා පනතට හා පළාත් පාලන සේවා රෙගුලාසිවලටත්, කොමිෂන් සභාව විසින් කලින් කලට නියම කරනු ලබන අනිකුත් සේවා කොන්දේසිවලටත් යටත් වෙයි.

3. සේවයට බාර ගැනීම පිළිබඳ කොන්දේසි.—(අ) 1952 අගෝස්තු මස 8 වැනි දිනය හා 10,432 වැනි අංකය දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසෙහි පළ කරන ලද උපලේඛනයෙහි සඳහන් තනතුරුද, කලින් කල ඒ උපලේඛනයට එකතු කරන අනික් තනතුරුද, විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය යටතට මාරුකරනු නොලැබූ ස්ත්‍රීන් නොවන පළාත් පාලන සේවා සමාජිකයින් විසින් උසුලනු ලබද්දී, 1962 පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් ක්‍රම රෙගුලාසි යටතේ, විශ්‍රාම වැටුප් සහිත තනතුරු වන්නේය.

(ආ) ආණ්ඩුව යටතේ සේවය කරන නිලධාරීන් ආණ්ඩුවේ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවල 21 වැනි වගන්තිය යටතේ සේවයෙන් මුදා හරිනු ලැබ පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මාරුකර හරිනු ලැබුවහොත්, ඔවුන්ගේ විශ්‍රාම වැටුප් අයිතිවාසිකම් ආරක්ෂා වේ.

(ඇ) ප්‍රාදේශීය බලමණ්ඩලවල විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථාවේ නියෝග හෝ යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරණ සේවකයන් සම්බන්ධයෙන් වූ විට, ඔවුන් අවසානයේදී සේවයෙන් විශ්‍රාම ගැනීමේදී ඔවුන්ට විශ්‍රාම වැටුප් ගෙවීම තීරණය කරනු ලබන්නේ, 1969 අංක 18 දරණ පළාත් පාලන සේවා පනත ප්‍රකාර, පළාත් පාලන සේවයට මාරුකරනු ලැබූ දිනයට ඉස්සරින්ද ඔවුන් සේවයේ යෙදී සිටි ප්‍රාදේශීය බලමණ්ඩලයෙහි විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථා හා නියෝග අනුවය.

(ඈ) පළාත් පාලන විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම රෙගුලාසි යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුබවට ප්‍රකාශ කරනු නොලැබූ තනතුරුවලට කෙරෙන පත්වීම් සම්බන්ධයෙන් වූ විට, එම තනතුරුවලට පත්කරනු ලබන අය 1969 අංක 18 දරණ පළාත් පාලන සේවා පනතෙහි 18 වන වගන්තිය යටතේ පිහිටවනු ලැබූ පළාත් පාලන සේවා අර්ථසාධක අරමුදලට, ස්වකීය වැටුපෙන් සියයට පහක් (5%) දයක මුදල් වශයෙන් ගෙවිය යුත්තාහ. අදළ නිලධාරීන්ගේ වැටුපෙන් සියයට හත හමාරක් (7½%) ඔවුන් පත්කරනු ලබන ප්‍රාදේශීය බලමංඩලය විසින් ඔවුන් වෙනුවෙන් ගෙවනු ලැබේ.

(ඉ) ස්ත්‍රීන්ද, වයස 55 ට වැඩි නිලධාරීන්ද පළාත් පාලන සේවයට පත්කරන ලද දිනයට ඉස්සරින්ද ආණ්ඩුව යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරූ නිලධාරීන්ද හැර විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කෙරෙන සියලු දෙනාටම, 1952 ජූනි 30 වැනි දිනය හා 10,329 වැනි අංකය දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් රෙගුලාසි යටතේ පිහිටුවන ලද පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට ස්වකීය අනුමාන මූලික වැටුපෙන් සියයට හතරක (4%) මුදලක් ගෙවීමට නියම කරනු ලැබේ. ප්‍රාදේශීය බලමණ්ඩලය විසින් ඒ ඒ නිලධාරියාගේ අනුමාන මූලික වැටුපෙන් සියයට තුනක (3%) දයක මුදලක් ගෙවනු ලැබේ.

(ඊ) ප්‍රාදේශීය බලමණ්ඩලය විසින් නියම කරනු ලබන මුදලක්, මුලින්ම හෝ පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ඇපකාර සමාගමක් මගින් ඉදිරිපත් කරන විශ්වාස සහතික ඇප ඔප්පුවක් මගින් හෝ ඇප තබන ලෙස මේ තනතුරුවලට පත්වන්නන්ට නියම කළ හැකිය.

(උ) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දනටම පළාත් පාලන සේවයට අයත් උපලේඛනගත තනතුරු නොදරන්නන්ට දිවයිනේ කවර පෙදෙසක වුවද සේවය කිරීම සඳහා ශාරීරික වශයෙන් ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස සුදුසුකම් ලත් වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

(ඌ) අන්‍යාකාරයකින් නියමකොට නැති කල්හි සාමාන්‍යයෙන් පත්වීම අවුරුදු තුනක ආධුනික කාලයකට හෝ අවුරුදු තුනකින් පසු ස්ථිර කරනු ලැබීමට හෝ යටත් වෙයි.

(එ) අයදුම්කරුවන්, නියම කරනු ලැබූ අවස්ථාවක ඔවුන්ගේ උප්පැන්න සහතික හෝ අනුමාන වයස පිළිබඳ සහතික ඉදිරිපත් කිරීමට සූදානම් වී සිටිය යුතුයි.

(ඒ) පත්කරනු ලබන අය දිවයිනෙහි ඕනෑම පෙදෙසක සේවය කළ යුතුයි.

4. පළාත් පාලන සේවයට නව ප්‍රවේශක නිලධාරීහු.—(i) අදළ පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත්කරනු ලැබූ නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂා කාලය යම්කිසි තනතුරු වෙනුවෙන් වඩා දීර්ඝ කාලයක් නියමකොට නැත්නම්, අවුරුදු 3ක් වන්නේය.

(ii) 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධානවලටත්, ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා දනට පවත්නා වූත් හෝ මිනිමතු සම්පාදනය කළහැකි වූ කිසියම් නියෝග හෝ නීතිරීතිවලට එකඟවීමේ කොන්දේසියට සියලුම නව ප්‍රවේශක නිලධාරීන් එකඟ විය යුතුය.

(iii) රාජකාරි කටයුතු කාර්යක්ෂම ලෙස ඉටුකිරීමෙහි ලා අත්‍යවශ්‍ය නොවන්නාවූ විශේෂ අවස්ථාවන්හිදී හැර, ඔවුන් ස්වකීය ආධුනික/වැඩ පරීක්ෂණ කාලපරිච්ඡෙදය ඇතුළත රාජ්‍ය භාෂාව වන සිංහලෙන් වැඩ කිරීමේ දනුමක් ලබාගත යුතුය.

(iv) ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂණ කාලය අවසානයේදී පත්වීම ස්ථිර කිරීම, අනිකුත් කරුණු අතර, නියමිත කාලසීමාව තුළදී කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර තත්ත්වයට වඩා ඉහළ නොවන මට්ටමක් දක්වා වූ සිංහල පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණවලින් සමත්වීම උඩ රඳා පවතී. නියමිත කාලසීමා ඇතුළතදී මෙම පරීක්ෂණවලින් අසමත්වීමේ ප්‍රතිඵලයක් වශයෙන් එසේ නියමිත පරීක්ෂණවලින් සමත්වන තුරු, නියමිත වැටුප් වැඩිවීම් නොගෙවනු ලබන අතර, ස්වකීය ආධුනික කාලය/වැඩ පරීක්ෂණ කාලය අවසාන වනවිට, සිංහල ප්‍රවීණතාවය පිළිබඳ නියමිත තත්ත්වය ලබා ගැනීමට අසමත් වන නිලධාරීන්ගේ සේවය අවසන් කරනු ලැබිය හැකිය.

(v) අධ්‍යාපනික සහ අනිකුත් සුදුසුකම්.—ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ ඊට උසස් විභාගයකින් හෝ සාමාර්ථ්‍යය අඩුම සුදුසුකම වශයෙන් නියමකොට ඇත්තා වූ සෑම බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටියකදීම සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ සිංහලයෙකු වන අයදුම්කරුට ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් ලබන ලද සිංහල භාෂාව පිළිබඳ හෝ ඊට සමාන විෂයයකින් සම්මානයක් තිබිය යුතුය.

(1963 පෙබරවාරි මස 8 වැනි දිනට පූර්ව වූ දිනයක සිට පළාත් පාලන සේවයේ සිටියා වූත්, පළාත් පාලන සේවයේ වෙනත් තනතුරු ඉල්លුම් කරන්නාවූත් නිලධාරීන් කෙරෙහි මේ අවශ්‍යතාව අදළ නොවේ.)

සටහන.—(i) පළාත් පාලන සේවයට ඇතුලුවීම සඳහා සිංහල මාධ්‍යයෙන් සුදුසුකම් ලබාගන්නා අය, තනතුර ස්ථිර කිරීම සඳහා පූර්ව අවශ්‍යතාවයක් වශයෙන් වූ සිංහල ප්‍රවීණතා පරීක්ෂණ සමත්වීමෙන් නිදහස් කරනු ලබති.

(ii) රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ පරමාර්ථයන් සඳහා, " නව ප්‍රවේශක " යන පදය අදල වනුයේ 1960.1.29 දින හෝ ඊට පසුව ප්‍රසිද්ධ කරන ලද ගැසට් නිවේදන අනුව පළාත් පාලන සේවයේ තනතුරුවලට පළමුවරට පත්කරනු ලබන නිලධාරීන්ටය.

(iii) රජයේ සේවයෙහි නියැලිව සිට, පළාත් පාලන සේවයේ තනතුරු භාරගැනීම සඳහා සේවයෙන් නිදහස් කරනු ලබන්නාවූ " ආදි ප්‍රවේශක නිලධාරීන් " කෙරෙහි ඉහත 4 වැනි ඡේදයේ (iii) හා (iv) දරණ ඡේදවල සඳහන් විධිවිධාන අදල නොවේ.

5. සෑම අයදුම්කරුවෙකු විසින්ම, තමා ලාංකිකයකු බවට සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි. " ලාංකිකයා " යනු පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියෙකු වූවෙකි.

6. සේවාමුක්ත භටයින් සඳහා අනුග්‍රහ.—(අ) සේවාමුක්ත වූ අයදුම් කරුවනට, ඔවුන්ගේ නිත්‍ය භට හමුදා සේවා කාලය, තම වයසින් අඩුකර ගැනීමෙන්, ඉල්ලුම්කර ඇති තනතුරුවල නියමිත උපරිම වයස් සීමාව ඇතුළතට පැමිණිය හැකිවන අවස්ථාවක නිත්‍ය භට සේවා කාලපරිච්ඡෙදය එසේ අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

(ආ) සේවයේ යම්කිසි තනතුරක් සඳහා බඳවා ගැනීමේ ක්‍රියා පරිපාටියෙහි නියමිත අඩුම අධ්‍යාපන සුදුසුකම, ඊළඟට පහළින් ඇති විභාගය දක්වා අඩු කිරීමට සේවා මුක්තයන් වන අයදුම්කරුවනට අවසර දෙනු ලැබේ.

7. වයස පිළිබඳ අනුග්‍රහය.—පළාත් පාලන සේවයේ තනතුරු සම්බන්ධයෙන් පළ කෙරෙන පුරප්පාඩු සඳහා වයස් සීමාවන් ගැන නොතකාම අයදුම්පත් එවීමට ස්ථිර තනතුරක් දරණ, වර්ෂ දෙකක අඛණ්ඩ සේවාවක් ඇති ප්‍රාදේශීය බලමණ්ඩලයන්හි සේවකයන්ට පුළුවන.

8. වෙනත් අවශ්‍ය කරුණු.—(i) දනට පළාත් පාලන මණ්ඩලයක සේවයේ යෙදී සිටින නිලධාරීන් අයදුම්පත් තම තමන් සේවය කරන ප්‍රාදේශීය බලමණ්ඩල සභාපති මගින් හෝ නාගරික කොමසාරිස්වරයා මගින් හෝ ඉදිරිපත් කළ යුතුයි.

(ii) දනට ආණ්ඩුවේ සේවයෙහි යෙදී සිටින නිධලාරින්ගේ අයදුම්පත් ඉදිරිපත් කළ යුත්තේ ස්වකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන්ගේ මාර්ගයෙනි. ආණ්ඩුවේ සේවයේ ස්ථිර තනතුරු දරණ නිලධාරීන් එවන අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී, ඒ ඒ දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් විසින්ම එම අයදුම්කරුවන් තෝරාගනු ලැබුවහොත්, ඔවුන් ස්වකීය තනතුරුවලින් මුදාගන්නට තමන් සූදානම්ව සිටින්ද නැද්දයි සඳහන් කළ යුතුය.

(iii) සම්මුඛ පරීක්ෂණයක් හෝ ලිඛිත පරීක්ෂණයක් සඳහා නියමිත වේලාවක, දන්වනු ලබන ස්ථානයකට පැමිණෙන ලෙස අපේක්ෂකයන්ට නියම කරනු ලැබිය හැකිය. මේ සම්බන්ධයෙන් කිසිම ගමන් වියදමක්, අන්කිසි වියදමක් හෝ ගෙවනු නොලැබේ.

(iv) කිසිම අපේක්ෂකයෙකු ගැන නිර්දේශයක් කිරීමට යම් තැනැත්තකුට වුවමනා නම්, ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමේ වුවද අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ, බලපෑවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුවහොත්, ඒ හේතුවෙන්ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත් වන්නේ ය.

(v) යම් අයදුම්කරුවකුගේ අයදුම්පතෙහි යම්කිසි අසත්‍ය තොරතුරක් සඳහන්කොට තිබෙන බැව් ඔහු තෝරාගැනීමට කලින් දැනගන්නට ලැබුණි නම්, ඒ හේතුවෙන්ම එම තනතුරට නුසුදුස්සකු බවට පත්කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම්, රාජකාරියෙන් පහ කරනු ලැබීමටත් ඉඩ තිබේ.

(vi) මේ දැන්වීමේ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වුවත් නොගැලපෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(vii) පහත සඳහන් ආකෘති පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පත්, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත (ඔහුගේ පෞද්ගලික නමට නොවේ.) එවිය යුතුයි.

(viii) අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනයෙන් පසු මේ කාර්යාලයට ලැබෙන අයදුම්පත් සාමාන්‍යයෙන් සළකා බලනු නොලැබේ. අයදුම්පතක් තැපෑලේදී ප්‍රමාද වූ බවට හෝ නැති වූ බවට කෙරෙන කිසිම පැමිණිල්ලක් සළකා බලනු නොලැබේ. අවසාන දිනය වනතුරු ස්වකීය අයදුම්පත් ඉදිරිපත් කිරීම ප්‍රමාද කරන අයදුම්කරුවෝ තුමූම ඒ අවදානමට මුහුණ පාති.

**අන්‍යාකාරයකින් සඳහන්කොට නැති කල්හි භාවිත කළ යුතු අයදුම්පත් ආකෘතිය**

## පළාත් පාලන සේවය

සැ.යු.—(i) අයදුම් පත්‍ර පහත සඳහන් ආකෘතියෙහි පිළියෙල කොට, තනතුරු අදළ වන ගැසට් නිවේදනයෙහි සඳහන්, අයදුම් පත්‍ර භාර ගන්නා අවසාන දින හෝ ඊට පළමු, කොළඹ 1, තැ. පෙ. 530, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන්නට එවිය යුතුයි. අයදුම් පත්‍ර, ලේකම්ගේ පෞද්ගලික නමට නොඑවිය යුතුයි.

(ii) තනතුරු ඉල්ලා සිටීම සඳහා තමා සාකල්‍යයෙන්ම සුදුසු බැව් නිශ්චය කරනු පිණිස, තම අයදුම්පත්‍ර පිළියෙල කිරීමට පළමු ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසි හා ගැසට් නිවේදනයේ අවශ්‍යතාද සැළකිල්ලෙන් කියවා බලන ලෙස අයදුම්කරුවන්ට අවවාද කරනු ලැබේ. ගැසට් නිවේදනය බලා අදළ සියලුම තොරතුරු සැපයීමට අයදුම්කරුවෝ වග බලාගත යුතුය.

(iii) පහත සඳහන් ලේඛනවල පිටපත්, අයදුම්කරුවෝ ස්වකීය අයදුම් පත්‍රවලට ඇමිණිය යුතුය. (1) ඉංග්‍රීසි, සිංහල, දෙමළ යන භාෂාවලින් සමත්වී ඇති උසස්ම විභාගය පිළිබඳ සහතිකය, (2) චරිත සහතිකය (3) ඉල්ලා සිටින තනතුර සම්බන්ධයෙන් අදළවන වෘත්තිය/ශිල්පීය සුදුසුකම් පිළිබඳ සහතිකය.

(iv) ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසිවල 8 වැනි ඡේදය කෙරෙහි විශේෂ සැළකිල්ල යොමු කරන්න.

—————————තනතුර සඳහා වූ අයදුම් පත

1. (අ) පුරප්පාඩුව ප්‍රසිද්ධකොට ඇති ගැසට් පත්‍රයේ දිනය :————.
   (ආ) ඉල්ලුම්කර සිටින තනතුර :————.

2. සම්පූර්ණ නම පැහැදිලි අකුරෙන් :————.
   ජාතිය :————.
   (එම ලියාපදිංචිවීමෙන් ලාංකිකයෙකු වී නම්, පුරවැසි භාවය පිළිබඳ සහතිකයේ දිනයත්, සැඳැහුම් අංකයත් සඳහන් කරන්න.)

3. තැපැල් ලිපිනය :————
   (ලිපිනය වෙනස් වූ වහාම ඒ බව දන්වා එවිය යුතුයි.)

4. (අ) අයදුම් පත්‍ර භාරගන්නා අවසාන දිනයට නියම වයස :—
   අවුරුදු :————, මාස :————, දින :————.
   (ආ) උපන් දිනය :————.

| අවුරුද්ද | මාසය | දිනය |
|---|---|---|
| | | |

5. උපන් ස්ථානය :—
   (අ) අයදුම්කරු :————
   (ආ) අයදුම්කරුගේ පියා :————.
   (ඇ) අයදුම්කරුගේ පියාගේ පියා :————.
   (ඈ) අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ මුත්තා :————.
   (අයදුම්කරු ලංකාවේ උපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) හෝ (ඇ), (ඈ) යන දෙකම හෝ පිරවිය යුතුයි. ඔහු ලංකාවේ නූපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) සහ (ඇ) හෝ (ඈ) සහ (ඇ) පිරවිය යුතුයි.)

6. විවාහකද ? අවිවාහකද ? වැන්දඹුද ? :————.

7. වයස අවුරුදු 12 සිට ඉගෙන ගත් පාඨශාලා, විද්‍යාල සහ අනිකුත් ආයතන :—

සාමාන්‍ය අධ්‍යාපනය

| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

වෘත්තීය/ශිල්පීය අධ්‍යාපනය

| විද්‍යායතනය | සිට | දක්වා |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

8. අධ්‍යාපන සුදුසුකම් හා අන්තිමට සමත් වූ විභාගය දිනයත් සමග :—
   (අ) සිංහල :————.
   (ආ) ඉංග්‍රීසි :————.
   (ඇ) දෙමළ :————.

9. ලබාගෙන ඇති වෘත්තීය සහ ශිල්පීය සුදුසුකම් ලැබූ දින හා ආයතනවල නම් :————.

10. වෘත්තීය/කාර්මික/කර්මාන්ත පළපුරුද්ද :—.

| ආයතනයේ නම | ආධුනිකත්වයේ ස්වභාවය/ දැරූ තනතුර | සිට | දක්වා |
|---|---|---|---|
| | | | |

(සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි.)

11. (අ) පාඨශාලාවෙන් අස් වූ දින සිට කළ රක්ෂා (පත් වූ දිනයත් හා අස් වූ දිනයත් දක්වමින් දරූ තනතුරු සඳහන් කරන්න.) :————.

(ආ) මීට පළමු, ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලනායතනයක් යටතේ ස්ථිර වශයෙන් හෝ තාවකාලික වශයෙන් හෝ රක්ෂාවෙහි යෙදී සිටියේ නම් සහ ඒ සේවය නතර කිරීමට ඇති හේතු හා එසේ කළ දින පැහැදිලි වශයෙන් දක්වන්න :————.

(ඇ) පළාත් පාලන ආයතනවල සේවා කාලය පිළිබඳ සටහන් (තනතුරු) පළාත් පාලනායතන හා කාල සීමාවන් :————.

(ඈ) දැනට කරන රක්ෂාව—පහත සඳහන් විස්තර දෙන්න :—
   (i) තනතුරේ පදවි නාමය, ශ්‍රේණිය හා ඊට පත්වූ දිනය :————.
   (ii) දීමනා හැර දැනට ලබන වැටුප හා වැටුප් ක්‍රමය :————.
   (iii) විශ්‍රාම වැටුප් සහිතද ? :————.

(ඉ) සේවා මුක්ත භටයෙක් නම්—සේනාංකය, තරාතිරම, සේවයට බැඳුන දිනය හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————.

12. කියවීම, ලිවීම, කථා කිරීම, භාෂණ පරිවර්තනය පිළිබඳව ප්‍රවීණතාවක් ඇද්ද :—
   (අ) සිංහල :————.
   (ආ) දෙමළ :————.

13. විශේෂ සුදුසුකම්.—ගැසට් නිවේදනයෙහි සඳහන්කොට ඇති විශේෂ සුදුසුකම් සහ/හෝ පළපුරුද්ද ඔබට තිබේද ? එසේනම්, ඒ පිළිබඳව සම්පූර්ණ විස්තර, දින වකවානු සහිතව සඳහන් කරන්න :————.

14. කිසියම් අපරාධ වරදක් සඳහා අධිකරණය මගින් වරදකරු කරනු ලැබුවේද ? එසේනම් දිනය, නඩු අංකය හා වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :—

15. මුදල් කරදරවලින් සිදහස්ද ? එසේ නැත්නම්, ඔබේ ණය බැඳීම්වල ප්‍රමාණය කොතෙක් ද ? :————.

16. වෙනත් විස්තර (විශේෂ හිමිකම් ආදිය) :————.

17. චරිත සහතික ලබාරත් අයගේ නම් සහ පදවි නාම :————.

(ඉදිරිපත් කළ යුත්තේ ඒ සහතිකවල මුල් ලිපි නොව, පිටපත් පමණි. පළාත් පාලන සේවයේ උපලේඛනගත තනතුරු දරණ සාමාජිකයින් විසින් මේ නියමයේ ප්‍රකාර ක්‍රියා කළ යුතු නොවේ.)

මේ අයදුම් පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරා ගනු ලැබීමට පළමු සොයාගනු ලැබුවහොත්, මා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත්, වන්දිමක් නොමැතිව මා සේවයෙන් පහකළ හැකි බවත් මම දනිමි.

————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්,
කෑ. පෙ. 530,
කොළඹ 1.

---

## සහායක කම්බිකරු තනතුර—දන්කොටුව සුළු නගර සභාව

ඉහත සඳහන් තනතුර සඳහා දන්කොටුව සුළු නගර සභා ප්‍රදේශය තුළ ස්ථිර පදිංචි කරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

2. වැටුප් ක්‍රමය.—රු. 2,154—8×54—රු. 2,586 වැටුප් ක්‍රමයක රු. 2,316 වාර්ෂික වැටුපට පළමු කායයීක් ළමතා කඩඉමකි. තනතුර ස්ථිරය. අර්ථසාධක අරමුදල්වලට හිමිකම් තිබේ.

3. අවශ්‍ය සුදුසුකම් :—

(අ) වයස.—1970. 9. 1 දිනට වයස අවුරුදු 18 ත් 35 ත් අතර විය යුතුය.

(ආ) අයදුම්කරුවන් අඩු වශයෙන් සිංහල/දෙමළ 7 වැනි ප්‍රමාණයෙන් සමත්ව සිටිය යුතුය.

(ඇ) අයදුම්කරුවන් ලංකා කාර්මික විද්‍යාලයේ විදුලිය කම්බි ඇදීම පිළිබඳ පාඨමාලාව හෝ විදුලි කම්බි ඇදීම පිළිබඳ කම්කරු දෙපාර්තමේන්තුව මගින් මෙහෙයවන පාඨමාලාව හෝ සාර්ථක ලෙස සම්පූර්ණකර ඇති අයවිය යුත්තාහ.

(ඈ) අයදුම්කරුවෝ පළාත් පාලන ආයතනයක, ආණ්ඩුවේ ආයතනයක හෝ සංස්ථාවක විදුලි ආලෝක ව්‍යාපාරයන්හි යටත් පිරිසෙයින් අවුරුදු 10 ක පළපුරුද්දක් ඇතිව සිටිය යුතුය.

ඉහත සඳහන් (ඈ) කොටසේ සඳහන් සහතික ඇතොත් නගර විදුලි ආලෝක ව්‍යාපාරයන්හි යටත් පිරිසෙයින් අවුරුදු 2 ක පළපුරුද්දක් ඇති අය කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

4. අයදුම්පත්.—පත්වීම් සම්බන්ධයෙන් රජයේ ගැසට් පත්‍රයේ IV කාණ්ඩයේ යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ අයදුම් පත්‍රයට සාරානුකූලව සකස්කොට 1970.8.30 වැනි දිනට පෙර දන්කොටුව සුළු නගර සභාවේ සභාපති වෙත ලැබෙන සේ එවිය යුතුය.

ඩී. වී. ජයකොඩි,
දන්කොටුව සුළු නගර සභාවේ සභාපති.

1970.8.10 වැනි දින,
දන්කොටුව සුළු නගර සභා කාර්යාලයේ දී ය.

8-798—70.8.21 දින අංක 14,920 දරන ගැසට් පත්‍රය

---

# අතුරු ව්‍යවස්ථා

ඇල්.ඩී.—බී. 18/42

## ගම් සභා ආඥාපනත

(257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 42 වැනි වගන්තිය යටතේ ගාලු දිස්ත්‍රික්කයේ කොඩාගොඩ ගම් ප්‍රදේශයේ ගම් සභාව විසින් පනවනු ලැබ ඒ වගන්තියේ (3) වැනි උප වගන්තිය යටතේ රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාව.

පී. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා සවදේශ කටයුතු අමාත්‍යාංශයේ සථිර ලේකම්.

1970.8.7 දින,
කොළඹ දී ය.

### අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාර පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

1961 මාර්තු 3 දින අංක 12,304 දරන ගැසට් පත්‍රයෙහි පළ කරන ලද අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාර පිළිබඳ අතුරු ව්‍යවස්ථා දක්වෙන අයුරු මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) (1) වැනි ඡේදය අගට පහත සඳහන් කරුණු එකතු කිරීමෙන් :—

නරක් විය හැකි අහාර ද්‍රව්‍ය හා කුළු බඩු තොග වශයෙන් විකිණීම සඳහා ගබඩා කිරීම.

ලී වෙළඳ සැලක් පවත්වාගෙන යාම.

රේඩියෝ අළුත්වැඩියා කිරීමේ සාප්පුවක් හෝ රේඩියෝ කර්මාන්ත ශාලාවක් පැවැත්වීම.

හුණු පෝරණුවක් පවත්වාගෙන යාම.

රස කැවිලි සෑදීම.

තීන්ත හෝ වාර්නිෂ් ගබඩා කිරීම.

ගිස් ගෝනි ගබඩා කිරීම.

අඟුරු ගබඩා කිරීම.

යන්ත්‍රානුසාරයෙන් හෝ විදුලි බලයෙන් නූල් කැටීමේ හා රෙදි විවීමේ ආයතනයක් පැවැත්වීම.

බෙලෙක් වැඩ කිරීමේ ස්ථානයක් පැවැත්වීම.

දර මඩුවක් පැවැත්වීම.

හො. 100 වැඩි ප්‍රමාණයක් සිමෙන්ති ගබඩා කිරීම.

දුම්කොළ ගබඩා කිරීම.

පුවක් ගබඩා කිරීම.

(2) (2) වැනි ඡේදයේ අගට පහත සඳහන් කරුණු එකතු කිරීමෙන් :—

සිසිල් බීම සෑදීම.

යන්ත්‍රානුසාරයෙන් මිරිස්, කෝපි, පිටි, ධාන්‍ය, කුළු බඩු හෝ වෙනත් මාෂබෝග ඇඹිරීම.

මෝටර් ගරාජයක් පවත්වාගෙන යාම.

පැස්සීමේ හෝ අම්ලකර පැස්සීමේ ස්ථානයක් පැවැත්වීම.

මෝටර් වාහන සර්විස් කිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම.

කොහු මෝලක් පවත්වාගෙන යාම.

රන්රිදී ආභරණ සෑදීම.

ටයර් හෝ ටියුබ් වල්කනයිස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.

බයිසිකල් අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පැවැත්වීම.

වඩු වැඩ කිරීමේ ස්ථානයක් පැවැත්වීම.

ගෘහ භාණ්ඩ නිපදවීමේ ස්ථානයක් පැවැත්වීම.

යන්ත්‍රානුසාරයෙන් හෝ සෙක්කුවක් මගින් තෙල් නිෂ්පාදනය කිරීම.

ලියවන පට්ටලයක් පැවැත්වීම.

(3) (3) වැනි ඡේදයේ අගට පහත සඳහන් කරුණු එකතු කිරීමෙන් :—

ඉරුම් පට්ටලයක් නැතහොත් අතින් හෝ යන්ත්‍රානුසාරයෙන් ක්‍රියා කැරවෙන ලී මෝලක් පවත්වාගෙන යාම.

8-779—70.8.21 දින අංක 14,920 දරන ගැසට් පත්‍රය

ඇල්. ඩී.—බී. 61/53.

## ගම්සභා ආඥාපනත

(257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 42 වැනි වගන්තිය යටතේ ගාලු දිස්ත්‍රික්කයේ මාදම්පේ ගම් ප්‍රදේශයේ ගම් සභාව විසින් සම්පාදිතව එකී වගන්තියේ (3) වැනි උප වගන්තියෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමතිවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඔහු විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

පී. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 අගෝස්තු 7 වැනි දින,
කොළඹදීය.

### අතුරු ව්‍යවස්ථා

### වලක් කැණ හිරිගල් හෝ හුණුගල් ලබා ගැනීම

1. වලක් කැණ හිරිගල් හෝ හුණුගල් ලබා ගැනීමේ ව්‍යාපාරය අන්තරාදායක ව්‍යාපාරයක් වශයෙන් මෙයින් ප්‍රකාශ කර සිටිනු ලැබේ.

2. සභාපතිතුමා විසින් ඒ සඳහා නිකුත් කරනු ලබන බලපත්‍රයක් පිට මිස කිසිවකු විසින් 1 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කර්මාන්තය කරගෙන නොයා යුතුය.

3. 2 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් ලබාගෙන තිබෙන කිසිවකු විසින් :—

(අ) තමා එම ව්‍යාපාරය කරගෙන යන්නාවූ ඉඩමේ කිසියම් වැටක් හෝ මායිමක් වෙනස් කිරීම, විරූපී කිරීම හෝ ඊට අලාභ හානි සිදුවිය හැකි අන්දමේ වෙනත් කිසියම් ක්‍රියාවක් කිරීම, හෝ

(ආ) කිසියම් පොදු මාවතකට හෝ පාරකට අවහිර කිරීම, අලාභ හානි කිරීම හෝ එය බලෙන් අල්ලා ගැනීම හෝ

(ඇ) පෙර වෙරළේ යම් කොටසක හිරිගල් හෝ හුණුගල් හෑරීම නොකළ යුතුය.

4. සභාපතිතුමා විසින් හෝ සභාපතිතුමා විසින් ලියවිල්ලකින් බලය පවරන ලද සභාවේ ඕනෑම නිලධාරියෙකු විසින් හෝ 1 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කර්මාන්තය කරගෙන යන්නා වූ ඕනෑම ඉඩමකට ඕනෑම සුදුසු වේලාවකදී ඇතුල්ව එය පරීක්ෂා කර බැලීම නීත්‍යානුකූල විය යුතු අතර, සභාපතිතුමාට හෝ එකී බලය ලත් නිලධාරියාට එකී ඉඩමට ඇතුළුවීමට සහ ඒ ස්ථානය පරීක්ෂා කිරීමට අවසර දීම 2 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් ලබා සිටින තැනැත්තාගේ හෝ එකී ස්ථානය ඒ අවස්ථාවේ භාරව සිටින වෙනත් අයකුගේ යුතුකම විය යුතුය.

5. සභාපතිතුමා විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු විසින් හෝ 1 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ව්‍යාපාරය කරගෙන යන්නාවූ කිසියම් ස්ථානයක් පරීක්ෂාකර බැලීමේදී, එකී ව්‍යාපාරය සම්බන්ධයෙන් එකී ස්ථානයේ සේවයේ යොදවා ගෙන සිටින කිසියම් කෙනකුගෙන් ඔහුගේ දැනීමේ හැටියට ඔහුගේ ස්වාමියා හැඳින ගැනීම පිළිබඳ තොරතුරු සැපයීමට නියම කළ හැකි අතර, එවැනි තොරතුරු සැපයීම එවැනි තැනැත්තකුගේ යුතුකම විය යුතුය.

6. මෙම අතුරු ව්‍යවස්ථාවලින් යම්කිසි අතුරු ව්‍යවස්ථාවක් කඩ කිරීම නිසා ගම්බද උසාවියකදී දෙවරක් හෝ ඊට වැඩි වර ගණනක් වරදකරු කරනු ලැබූ තැනැත්තකුගේ බලපත්‍රය, ඒ උසාවියෙන් නියමකරනු ලබන වෙනත් යම් දඬුවමකට අමතර වශයෙන්, අවලංගු කිරීම නීත්‍යානුකූල විය යුතු අතර, එසේ බලපත්‍රය අවලංගු කිරීම ගැන මොනම අලාභයක් වත් අයකර ගැනීමට අයිතිවාසිකමක් එවැනි තැනැත්තකු සතු නො විය යුතුය.

7. මෙම අතුරු ව්‍යවස්ථාවල "වලක්" යනුවෙන් හතරැස් අඩි 200 කට නොවැඩි බිම් ප්‍රමාණයක වලක් සහ

"සභාපති" යන්නෙන් මාදම්පේ ගම් සභාවේ සභාපති ද අදහස් කැරේ.

8–767—70.8.21 දින අංක 14,920 දරන ගැසට් පත්‍රය

---

ඇල්.ඩී.—බී. 19/63.

## යටියන්තොට සුළු නගර සභාව

### සුළු නගර සභා ආඥාපනත

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 152 වැනි සහ 156 වැනි වගන්ති යටතේ යටියන්තොට සුළු නගර සභාව විසින් සම්පාදිතව, ඒ ආඥාපනතේ 153 වැනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

පී. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 අගෝස්තු මස 5 වැනි දින,
කොළඹ දී ය.

### අතුරු ව්‍යවස්ථා

1. මේ අතුරු ව්‍යවස්ථා 1970 යටියන්තොට ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථා යනුවෙන් හැඳින්විය යුතුය.

2. කිසියම් වීථියක, පාරක, ඇලක හෝ වැවක සිට පෙනෙන පරිදි යම් ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කරවීම, ඒ සම්බන්ධයෙන් සභාපති විසින් නිකුත් කළ අවසර පත්‍රයක බලය යටතේ මිස, කිසිම තැනැත්තෙකු විසින් නොකළ යුතුය.

එසේ වුවද, මේ අතුරු ව්‍යවස්ථාවේ ඉහත කී විධි විධාන පහත සඳහන් දැන්වීම් වලින් යම් කිසිවක් සම්බන්ධයෙන්, ඒ ප්‍රචාරක දැන්වීම ආලෝකවත් කොට ඇතහොත් හෝ ඉහලින් සවිකරන සංඥා දැන්වීමක් වෙතොත් මිස, අදාළ නොවිය යුතුය—

(අ) එකතු වන ශුද්ධ ලාභ පුණ්‍යාධාර කටයුතු සඳහා යෙදවීම පිණිස පවත්වන යම් විනෝද කටයුත්තකට අදාළ ව කෙරෙන යම් දැන්වීමක් ;

(ආ) ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශනය කොට තබා ඇති ස්ථානයේ පවත්වනු ලබන යම් විනෝද කටයුත්තකට අදාළ වූ යම් දැන්වීමක් ;

(ඇ) රජය මගින් ප්‍රදර්ශනය කෙරෙන යම් ප්‍රචාරක දැන්වීමක් ;

(ඈ) ආගමික, දේශපාලන හෝ වෙනත් ප්‍රසිද්ධ රැස්වීමකට අදාළව කෙරෙන ප්‍රචාරක දැන්වීමක් ;

(ඉ) යම් ගොඩනැගිල්ලක ජනේලයක වූ ප්‍රචාරක දැන්වීමක් ;

(ඊ) "බදු දීමට තිබේ" යන ප්‍රචාරක දැන්වීමක් ;

(උ) "විකිණීමට තිබේ" යන ප්‍රචාරක දැන්වීමක් ;

(ඌ) ගෘහ නාම තහඩුවක් ;

(එ) ප්‍රමාණයෙන් වර්ග අඩි එකකට වැඩි නොවන, වෘත්තීය කාර්යයන් සඳහා පාවිච්චි කෙරෙන නාම තහඩුවක් ;

(ඒ) වෙළඳාම් කටයුතු සඳහා පාවිච්චි කරන වාහනයක, ඒ වාහනය අයිතිකරුගේ නම සහ ලිපිනය ප්‍රදර්ශනය කෙරෙන ප්‍රචාරක දැන්වීමක් හෝ ;

(ඔ) ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කෙරෙන ස්ථානයේ පවත්වා ගෙන යනු ලබන වෙළඳාමකට හෝ ව්‍යාපාර කටයුත්තකට අදාළ යම් ප්‍රචාරක දැන්වීමක් ;

3. (1) යම් ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම සඳහා කෙරෙන සෑම ඉල්ලීමක්ම, ඒ දැන්වීම ප්‍රදර්ශනය කිරීමට අදහස් කරන දිනයේ සිට යටත් පිරිසෙයින් දින හතකටවත් ප්‍රථම සභාපති වෙත ඉදිරිපත් කළ යුතුය.

එසේ වුවද විශේෂ අවස්ථාවලදී මේ ඡේදයේ ඉහත සඳහන් විධි විධානවල නියමිත කාලසීමාව තුළ ඉදිරිපත් කරනු නොලබන ඉල්ලුම් පත්‍රයක් සභාපති විසින් භාරගත හැකිය.

(2) (1) වෙනි ඡේදයේ සඳහන් සෑම ඉල්ලීමක් සමගම ඉල්ලුම්කරු විසින් ප්‍රචාරය කිරීමට බලාපොරොත්තු වන ප්‍රචාරක දැන්වීමේ පිටපතක් ඉදිරිපත් කළ යුතුය.

(3) (1) වන ඡේදයේ සඳහන් ඉල්ලීමක් සභාපති විසින් අනුමත කරන විටකදී ඒ ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශනය කිරීම සඳහා අවසර පත්‍රයට, මෙහි වූ උපලේඛනයේ සඳහන් ගණන් අනුව ගණන් බලන ලද ගාස්තුවක් ගෙවීමට සභාපති විසින් ඉල්ලුම්කරුට නියම කළ යුතුය. ඒ ගාස්තුව ගෙවන තෙක් ඒ අවසර පත්‍රය ඉල්ලුම්කරුට නිකුත් නොකළ යුතුය.

4. (1) ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම සඳහා අවසර පත්‍රයක් යම් තැනැත්තකුට නිකුත් කළ අවස්ථාවක—

(අ) ඒ ප්‍රචාරක දැන්වීමේ සෑම පිටපතකම, ඒ අවසර පත්‍රයේ අංකය සහ දිනය සඳහන් කිරීමට ; හෝ

(ආ) ඒ අවසර පත්‍රය සඳහා ගාස්තුවක් ගෙවූ බවට සළකුණක් වශයෙන් මුද්‍රා තැබීමේ කාර්යය සඳහා ඒ ප්‍රචාරක දැන්වීමේ හැම පිටපතක්ම සභාපති වෙත ඉදිරිපත් කිරීමට, සභාපති විසින් ඒ තැනැත්තාට නියම කළ යුතුය.

(2) මෙම අතුරු ව්‍යවස්ථාවේ (1) වෙනි ඡේදය යටතේ සභාපති විසින් යම් තැනැත්තකුට විධානයක් කළේ ද, ඒ තැනැත්තා විසින් ඒ විධානය ඉෂ්ට කළ යුතුය.

5. කිසිම තැනැත්තකු විසින් —

(1) සභාපති විසින් අනුමත කරන ලද ආකාරයට තනන ලද හා ගොඩ නගන ලද තෙරා යන ප්‍රචාරක දැන්වීමක් වෙතොත් මිස, ගොඩනැගිලි සීමාවේ සිට තිරස් අතට කෙළින් මැනීමෙන් පසුව පාරක් හෝ වීථියක් උඩින් අඟල් 6 කට වඩා දුර තෙරා යන සේ යම් ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කරවීම ;

(2) පොලවේ සිට අඩි විසි පහකට වඩා උස්වූ හෝ යම්කිසි වීථියක් හෝ පාරක් උඩින් නෙරා යන යම් දැන්වීම් පුවරුවක ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කරවීම ;

(3) යම් වීථියකට හෝ පාරකට යාබද ගොඩනැගිල්ලක මුහුණතට ඒ මුහුණතේ සීමාවලින් පිටතට නෙරා සිටින සේ දික්වූ, නැතහොත් උසින් පදික වේදිකාවේ හෝ පොලවෙහි මධ්‍ය සමතාවයේ සිට සංඥවේ යට මට්ටම දක්වා ඇති දුර ප්‍රමාණයෙන් සතරෙන් එකකට වඩා කිසිම තැනක් වැඩිවූ යම් වෙළඳසැල් සංඥවක් සවි කරවීම හෝ එල්ලා තැබවීම ;

(4) සභාපති විසින් අනුමත නොකල ආකාරයට ඉහලින් සවි කර දැන්වීම් සංඥවක් සැදවීම හෝ ඉදිකරවීම නොකළ යුතුය.

6. කිසිම තැනැත්තකු විසින් යම් ප්‍රසිද්ධ වන්දනීය ස්ථානයක, ප්‍රසිද්ධ උද්‍යානයක හෝ පැසිකිළියක හෝ යම් පාළමක, වීථියක, ලාම්පු කණුවක, විදුලි රථ මාර්ගයේ කණුවක හෝ විදුලි සංඥ හෝ විදුලි පණිවුඩ කණුවක කිසියම් ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කරවීම නොකළ යුතුය.

7. කිසිම තැනැත්තකු විසින්, යම් පාරක හෝ වීථියක ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමේ කාර්යය සඳහා කිසිම ගුවන් විදුලි යන්ත්‍රයක්, ග්‍රැමපෝන යක්, තූර්ය වාදන භාණ්ඩයක්, සීනුවක් හෝ වෙනයම් භාණ්ඩයක් පාවිච්චි නොකළ යුතුය.

8. (1) යම් ප්‍රචාරක දැන්වීමක් සභාපතිගේ අදහස අනුව අශෝභන හෝ නොනිසි තත්ත්වයක තිබේ නම් ඔහු විසින් ලිඛිත දැන්වීමක් මගින් ඒ දැන්වීමේ නියමිත කාළය තුළ ඒ ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශනය කිරීම නතර කරන ලෙස එය ප්‍රදර්ශනය කරවන තැනැත්තාට නියෝග කළ හැකිය.

(2) සභාපති විසින් (1) වෙනි ඡේදය යටතේ දැන්වීමක් බාර දෙනු ලැබූ තැනැත්තෙකු විසින් දැන්වීමේ කාලය ඇතුලත දී ඒ දැන්වීම් අනුව ක්‍රියා කළ යුතුය.

9. ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශනය කිරීම සඳහා පාවිච්චි කරනු ලබන යම් දැන්වීම් පුවරුවක අයිතිකරු හෝ බදුකරු විසින්—

(අ) එම දැන්වීම් පුවරුව නිසි පරිදි අළුත්වැඩියා කර සුරක්ෂිත තත්ත්වයක පවත්වාගෙන යා යුතු අතර ;

(ආ) තමාගේ නම සහ ලිපිනය පහසුවෙන් කියවිය හැකි පැහැදිලි අකුරෙන් ඒ දැන්වීම් පුවරුවේ ඉදිරිපසින් ප්‍රකට ස්ථානයක පෙන්නුම් කළ යුතුය.

10. යම් ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමේ අවසර පත්‍රය සඳහා මුදල ගෙවූ බවට සළකුණක් වශයෙන් සභාපති විසින් එම දැන්වීමේ තබන ලද යම් සංඥවක්, සළකුනක්, අකුරක්, වචනයක් හෝ ඉලක්කමක් මැකීම හෝ මැකවීම කිසිම තැනැත්තකු විසින් නොකළ යුතුය.

11. කිසිම තැනැත්තකු විසින්—

(අ) සභාපති විසින් අනුමත කරන ලද ආකාරයට හෝ ස්වරූපයකට වෙනස් අයුරින් යම් ප්‍රචාරක දැන්වීමක් වාහනයක ප්‍රදර්ශනය කරවීමට සැලැස්වීම හෝ ;

(ආ) පොලිස් අධිකාරි විසින් අනුමත කළ ආලෝකමත් ප්‍රචාරක දැන්වීමක් හැර වෙනයම් ආලෝකමත් ප්‍රචාරක දැන්වීමක් ඇති යම් වාහනයක් යම් වීථියක හෝ පාරක පදවා ගෙන යාමට සැලැස්වීම, නොකළ යුතුය.

12. මෙම අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන වලින් යමක් කඩ කරමින් කටයුතු කරන යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර වරදකරු වීමේදී රුපියල් පනහකට වැඩි නොවන දඩයකට යටත් විය යුතු අතර, ඒ කඩ කිරීම දිගටම සිදු කරන අවස්ථාවකදී එසේ වරදකරු කිරීමෙන් පසුව හෝ ඒ කඩ කිරීම සම්බන්ධයෙන් අවධානය යොමු කොට සභාපති විසින් ලිඛිත දැන්වීමක් භාර දීමෙන් පසුව ඒ වරද සිදු කරන සෑම දිනයක් සම්බන්ධයෙන්ම රුපියල් පහලොවකට නොවැඩි තවත් දඩයකටද යටත් විය යුතුය.

13. පද සම්බන්ධයෙන් අන්‍ය අර්ථයක් අවශ්‍ය නොවුවහොත්, මෙම අතුරු ව්‍යවස්ථාවල '' ප්‍රචාරක දැන්වීම '' යන්නට ප්‍රචාරක දැන්වීමක ස්වභාවයේ වූ හෝ ප්‍රචාරක කාර්යයන් සඳහා සම්පූර්ණයෙන් හෝ කොටස් වශයෙන් පාවිච්චි කරනු ලබන්නාවූද, යම් ඉඩමක, ගොඩනැගිල්ලක හෝ ඉදිකිරීමක දක්වෙන්නාවූ ද නැතහොත් එහි රඳවා ඇත්තාවූ ද, යම් වචනයක්, අකුරක්, අංකයක්, සංඥවක්, දැන්වීම් කොලයක්, බෝඩ් එකක්, දැන්වීමක්, උපක්‍රමයක්, ආදර්ශයක් හෝ නිරූපනයක් ඇතුළත් වේ.

'' සභාපති '' යන්නෙන් සභාවේ සභාපති අදහස් වේ.

'' සභාව '' යන්නෙන් යටියන්තොට සුළු නගර සභාව අදහස් වේ.

'' දැන්වීම් පුවරුව '' යන්නෙන් යම් ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමේ කාර්යය සඳහා ඉදි කරනු ලබන හෝ පාවිච්චි කරනු ලබන යම් ඉදි කිරීමක්, උපස්ථම්භකයක්, කණුවක්, බෝඩ් ලෑල්ලක්, තාප්පයක්, පෙට්ටියක් හෝ වෙනස් උප ක්‍රමයක් අදහස් වේ.

'' ඉහලින් සවි කරන දැන්වීම් සංඥව '' යන්නෙන් යම් වීථියක, මාර්ගයක, ඇලක හෝ වැවක යම් තැනක සිට බැලූ විට සම්පූර්ණ වශයෙන් හෝ කොටස් වශයෙන් අහස පසුබිම් කොට පෙනෙන පරිදි යම් ඉඩමක, ගොඩනැගිල්ලක හෝ වෙනත් ඉදි කිරීමක හෝ එබන්දකට උඩින් දක්වෙන යම් කණුවකට, රිටකට, ද්වජයකට, රාමුවකට හෝ වෙනත් උපස්ථම්භයකට සවි කරන ලද ප්‍රචාරය කිරීමේ කාර්යය සඳහා වූ යම් වචනයක්, අකුරක්, ආදර්ශයක්, සංඥවක්, උපක්‍රමයක් හෝ නිරූපනයක් අදහස් වන අතර ප්‍රචාරය කිරීම සඳහා සම්පූර්ණ වශයෙන් හෝ කොටස් වශයෙන් යම් ඉඩමක, ගොඩනැගිල්ලක, ඉදි කිරීමක, වීථියක හෝ මාර්ගයක හෝ එබන්දකට උඩින් පාවිච්චි කරනු ලබන යම් බැලූනයක්, පැරෂූටයක්, ට්‍රේලර් එකක් හෝ වෙනත් එබඳු උප ක්‍රමයක් එයට ඇතුළත් වේ.

## උපලේඛනය

### අවසර පත්‍රය සඳහා අයකරන ගාස්තු ප්‍රමාණය

| ප්‍රචාරක දැන්වීමේ විස්තරය | අවසර පත්‍රය සඳහා ගාස්තු | | |
|---|---|---|---|
| | මාසයකට වැඩි එහෙත් හය මාසයකට නොවැඩි වන කල්හි | | හය මසකට වැඩි එහෙත් වර්ෂයකට නොවැඩි වන කල්හි |
| | රු. ශ. | | රු. ශ. |
| 1. බිත්තියක හෝ දැන්වීම් පුවරුවක ප්‍රදර්ශනය කැරෙන (චිත්‍රපටි පෙන්වීමට සම්බන්ධ ප්‍රචාරක දැන්වීමක් නොවන) ප්‍රචාරක දැන්වීමක් සඳහා එක් එක් හතරැස් අඩියකට ... ... | 0 75 | ... | 1 50 |
| 2. යම් තැනැත්තෙකු විසින් උසුලා ගෙන යනු ලබන හෝ ගමන් කරන වාහනයක සවිකොට ඇති පුවරුවක් මත ප්‍රදර්ශනය කැරෙන (චිත්‍රපටි පෙන්වීමට සම්බන්ධ ප්‍රචාරක දැන්වීමක් නොවන) ප්‍රචාරක දැන්වීමක් සඳහා— | | | |
| (අ) ඒ දැන්වීම වර්ග අඩි 6 කට වැඩි නොවන විට එක් එක් වර්ග අඩියකට ... | 0 75 | ... | 1 50 |
| (ආ) එම දැන්වීම වර්ග අඩි 6කට වැඩි වන විට එක් එක් වර්ග අඩියකට ... | 1 50 | ... | 3 0 |
| 3. චිත්‍රපටි පෙන්වීමට සම්බන්ධ ප්‍රචාරක දැන්වීමක් සඳහා එක් එක් හතරැස් අඩියකට ... | 0 25 | ... | 0 50 |

8–768—70.8.21 දින අංක 14,920 දරන ගැසට් පත්‍රය

---

# පලාත් පාලන සහා ඡන්ද ආඥපණත යටතේ දැන්වීම්

## ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥපනත (262 වැනි අධිකාරය)

